# පුරවැසි අධ්‍යාපනය හා පාලනය

## විෂය නිර්දේශය

10-11 ශ්‍රේණි

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## අභිමතාර්ථය

ශ්‍රී ලංකාවේ සුවිශේෂී ලෙසින් අරමුණු කරගෙන සිසුනට පාලනයේ හා ආර්ථික කටයුතු වල මූල ධර්මයන් හා ප්‍රායෝගික තලයන් අවබෝධ වන ආකාරයෙන් මෙම පාඨමාලාව සකස් වී ඇත. මෙමගින් ඔවුන් සමාජ පරිසරය තුල මිනිසාගේ ඵලදායී වර්ධනයට දායක වන ප්‍රජාතාන්ත්‍රික හා වගකිව යුතුද ව්‍යුහයන්හි හා ජීවන රටාවන්හි වැදගත්කම අගය කළ යුතුය.

## අරමුණු

- දේශපාලන සංකල්ප හා ඒවායේ ප්‍රායෝගික භාවිතයන් අවබෝධ කොට ගැනීම.
- ආණ්ඩුවේ අරමුණු හා අණ්ඩුවේ විවිධ අංශයන්හි ක්‍රියාකාරිත්වය අවබෝධ කොට ගැනීම.
- විවිධ දේශපාලනික මත විමසුම් පුළුල්ව විමර්ශනය කිරීමේ හැකියාව.
- විමර්ශනයේ හා ඇගයීමේ හැකියාව සමග ආර්ථික න්‍යායන් හා විවිධ ආර්ථික මූලධර්මයන් පිළිබඳ දැනුම.
- විවිධ ආයතන ,පුද්ගලයන්ට හා ඔවුන්ගේ අවශ්‍යතා ,ක්‍රියාකාරකම් , විෂයෙහි අවැසි ඵලය පිළිබඳ විචාරාත්මක අයබෝධයක්.

## ක්‍රමවේදය

මෙම විෂය මාලාවේ සිසුනට මූලික සිද්ධාන්තයන් පමණක් හඳුන්වාදෙන කොටස් ඇතුලත් ය. මේවායේ ඓතිහාසික වර්ධනයන් අදාල ලෙස හඳුන්වා දෙන අතරම සිසුන් ඇතැම් මූලධර්මයන් ශ්‍රී ලාංකික සංදර්භය තුල ප්‍රායෝගිකව භාවිතා කිරීමට පෙළඹවිය යුතුය.පාසල් පාදක ඇගයීම් ව්‍යාපෘති මගින් අනෙකුත් රටවල් හා සංසන්දනාත් 'මකව අධ්‍යනයන් කිරීමට යොමු කළ යුතු ය. ව්‍යුහයන් හා කාර්යයන් වෙන්කොට හඳුනා ගැනීමේ හැකියාව හා ඒවා සපුරා ගන්නා අරමුණු හා ක්‍රමවේද පිළිබඳවද අයබෝධය වර්ධනය කළ යුතු ය. පුරවැසියන් කෙරෙහි වගවීම මත පදනම් වූ ප්‍රජාතාන්ත්‍රීය පාලනයේ වැදගත්කම ඇගයිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# පුරවැසි අධ්‍යාපනය හා පාලනය

10 ශ්‍රේණිය (කාලච්ඡේද 10)

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
2. බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම
3. බහු සංස්කෘතික සමාජය
4. වෙළෙඳපල ආර්ථිකය හා ආර්ථික සමඳතා
5. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

11 ශ්‍රේණිය (කාලච්ඡේද 60)

6. අධිකරණ පද්ධති
7. මධ්‍ය ආණ්ඩුව, පළාත් පාලන ආයතන හා පළාත් සභා
8. මානව හිමිකම්, යුතුකම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය
9. පාරිසරික ගැටලු සහ තිරසාර සංවර්ධනය
10 ජාත්‍යන්තර සබඳතා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10 ශ්‍රේණිය

### 1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය (කාලච්ඡේද 30)

මෙහිදී සිසුන් ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත්කම හා අර්ථය යන සන්දර්භයේ පිහිටා ප්‍රජාතන්ත්‍රික පාලනයේ ව්‍යුහය හා සංකල්ප අවබෝධ කර ගැනීම කෙරේ යොමු කළ යුතුය.

නිපුණතා

1. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය හා විකාශය පිළිබඳව අධ්‍යයනය කරයි.
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ප්‍රධාන අංග ලක්ෂණ විශ්ලේෂණය කරයි.
3. රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස්කම් හා පුරවැසියා සතු හා පුරවැසියා කෙරෙහිවන වගකීම් සංසන්දනය කරයි.
4. ප්‍රජාතන්ත්‍රවාදයේ පරමාදර්ශ අභ්‍යන්තරීකරණ කර ගනියි.

විෂය අන්තර්ගතය

- ප්‍රජාතන්ත්‍රවාදය සංකල්පය නිර්වචනය කිරීම.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක විකාශය - ඍජු හා නියෝජන
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අංග ලක්ෂණ
  - ස්වර්ජන ඡන්දබලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයින් තෝරා ගැනීම.
  - තරඟකාරී පක්ෂ ක්‍රමය
  - නිදහස් හා සාධාරණ මැතිවරණ හා චන්ද කොට්ඨාශ ක්‍රමය
  - සමානාත්මතාව හා නිදහස පදනම් කොට ගෙන
  - ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම්වලට සහභාගී වීම.
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම.(බහුතරයේ කැමැත්ත පරිදි)
  - මාධ්‍ය නිදහස,හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය.

ඉහත දක්වන ලද ක්‍රමයන්ට අදාල විවිධ උදාහරණ හා ඒවායේ ඵලයන් පිළිබඳ සිසුන් අධ්‍යනය කළ යුතුය.

- රාජ්‍යය හා ආණ්ඩුව නිර්වචනය කිරීම.
- රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ස්වභාවය

(අ) රාජ්‍යයේ ස්වභාවය - ජාතික රාජ්‍යයේ ස්වභාවය, ජාතික රාජ්‍ය ගොඩනැංවීමේ ක්‍රියාවලිය, ජාතික රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප - ඒකීය හා සන්ධීය.

(ආ) ආණ්ඩුවේ ප්‍රධාන කොටස් හා ඒවායේ ක්‍රියාකාරීත්වය බලය,ව්‍යවස්ථාදායකය විධායකය හා අධිකරණය

- ආණ්ඩුවල ස්වරූප - පාර්ලිමේන්තු හා ජනාධිපති ක්‍රම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- රාජ්‍යයේ භූමිකාව - නීතිය හා සාමය පවත්වා ගැනීම,සුභසාධනය සැලසීම, ගැටුම් නිරාකරණය සහ සංවර්ධනය
- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක වැදගත්කම.
- ඉහත සංකල්පයන්හි ඓතිහාසික වර්ධනය හඳුන්වාදිය යුතු වන්නේ සමාජයීය වෙනස්කම් පිළිබඳ සන්දර්භයේ පිහිටා ය. සිසුන් ඉහත දක්වා ඇති රාජ්‍යයේ වගකීම් මත පදනම්ව යම් යම් පැතිකඩයන්හි අවශ්‍යතාව ඇගයීමට මෙන්ම ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයෙහිලා ඒවායේ ඇති වැදගත්කම සාකච්ඡා කිරීම සඳහා ද යොමු කළ යුතු ය.
- ඉහත කරුණු පිළිබඳ සාකච්ඡා, විවාද පැවැත්වීමට උනන්දු කරවිය යුතු අතරම මේ පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයන්හි යෙදෙන පරිදි ව්‍යාපෘති කෙරෙහි සිසුන් යොමු කළ යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 2. බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම. (කාලච්ඡේද 15)

මෙහිදී සිසුනට රටක පාලන අරමුණු සාක්ෂාත් කර ගැනීම හා ඵලදායි පරිපාලනයක් වර්ධනය කිරීම යන කරුණු මත පදනම්ව ආණ්ඩුවේ ව්‍යුහයන් විමර්ශනය සඳහා හැකියාව ලැබිය යුතුය.

### නිපුණතා

1. බලය විමධ්‍යගතකරණය හා බලය බෙදාහැරීම සංකල්ප අතර වෙනස හඳුනා ගනියි.
2. බලය විමධ්‍යගත කිරීමේ හා බලය බෙදාහැරීමේ ඒකකවල ව්‍යුහයන්, බලතල හා කාර්යයන් ගවේෂණය කරයි.
3. නූතන රාජ්‍යය තුළ ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීමේ අවශ්‍යතාව අගය කරයි.

### විෂය අන්තර්ගතය

- බලය විමධ්‍යගතකරණය හා බලය බෙදාහැරීමේ සංකල්ප හැඳින්වීම.
- අදාළ ඒකකවල ව්‍යුහයන්, ක්‍රියාකාරිත්වයන් හා බලය පිළිබඳ ගවේෂණයන් සමඟින් නූතන රාජ්‍යයන්හි බලය බෙදා හැරීම හා විමධ්‍යගත කිරීම පිළිබඳ උදාහරණ.
- තෝරාගත් උදාහණයන්හි මෑත කාලීන ව්‍යුහයාත්මක වෙනස්කම් පිළිබඳ නිදසුන්.
- ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමේහා විමධ්‍යගත කිරීමේ ඉතිහාසය.

සිසුන් රටක විවිධ මට්ටම් වලදී ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයන් පිළිබඳ සාකච්ඡා කිරීම. සඳහා මෙන්ම එකී ක්‍රියාකාරිත්වයන් මනාව සපුරාලීමේ දී බලය හා වගකීම් බෙදා හැරෙන ආකාරය ගවේශනය සඳහා ද පෙළඹවිය යුතුය. ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීම හා /හෝ බලය විමධ්‍යගත කිරීම පිළිබඳ තාර්කිකයෙන් පිරික්සිය යුත්තේ සමාජ අවශ්‍යතා මත පිහිටමිනි. මෙය සිදුවිය යුත්තේ ඓතිහාසික පසුබිමක මත පිහිටාය. ඒ වන්මන් ව්‍යුහයන්හි විස්තරාත්මක විමසුමක් 11 ශ්‍රේණියේ දී සිදුවන හෙයිනි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 3. බහු සංස්කෘතික සමාජය (කාලච්ඡේද 15)

මෙහිදී සිසුන්ට බහුවිධ සංස්කෘතික සමාජයක් යනු කුමක්දැයි අවබෝධ කොටගත හැකි විය යුතුවාක් මෙන්ම සියඹ පුරවැසියන්ගේ හිතසුව පිණිස එබඳු සමාජයක් වර්ධනය විය හැකි ආකාරයද අවබෝධ කොට ගත හැකි විය යුතුය.

### නිපුණතා

1. බහු සංස්කෘතික සමාජයේ ස්වභාවය අධ්‍යයනය කරයි.
2. බහු සංස්කෘතික සමාජය ගොඩනැංවීම හා එහි මූලික අංග ලක්ෂණ ගවේෂණය කරයි.
3. බහු සංස්කෘතික සමාජයක ජීවත්වීමේ වැදගත්කම හඳුනා ගනියි.

### විෂය අන්තර්ගතය

- බහු සංස්කෘතික සමාජය සංකල්පය සහ එහි මූලික ලක්ෂණ හැඳින්වීම.
- බහු සංස්කෘතික සමාජයක් ඇතිවීම කෙරෙහි බලපාන සාධක
- බහු සංස්කෘතික සමාජය හා නූතන රාජ්‍යය
- යහපාලනයක් සඳහා එකිනෙකාගේ දේශපාලන, සමාජය ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවන්ට ගරු කිරීමේ වැදගත්කම.

සිසුන් අනෙකුත් බහුවිධ සංස්කෘතික සමාජයන් පිළිබඳ උදාහරණ ගවේෂණය කොට එලදායි සහයෝගිතාව හා ජාතිය ගොඩනැගීම පිළිබඳව අගය කරමින් වාර්තා ඉදිරිපත් කළ යුතුය. ඒ අතරම අසාර්ථක වීම් පිළිබඳව උදාහරණ පිරික්සා සාර්ථක කරගැනීම සඳහා අදහස් විමසිය යුතුය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4. ආර්ථික ක්‍රම හා ආර්ථික සබඳතා (කාලච්ඡේද 15)

මෙහිදී ශ්‍රී ලංකාව මුහුණදෙන ගැටළු පිළිබඳ විශේෂිත අවධානය යොමු කරමින් සිසුනට ආර්ථික කටයුතු හා සංවිධානය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදෙනු ලැබේ.

### නිපුණතා

1. මූලික ආර්ථික ප්‍රශ්න හා ආර්ථික ක්‍රියාකාරකම් විමර්ශනය කරයි.
2. විවිධ අර්ථක්‍රම ගවේෂණය කරයි.
3. සංවර්ධනයට සාපේක්ෂව වර්තමාන ආර්ථික ක්‍රමය විශලේෂණය කරයි.
4. ශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීය කරණයේ බලපෑම අධ්‍යයනය කරයි.

### විෂය අන්තර්ගතය

- මූලික ආර්ථික ප්‍රශ්න හඳුනාගැනීම හා ආර්ථික ක්‍රියා නිර්වචනය.
- විවිධ අර්ථක්‍රම හඳුනා ගැනීම -සමාජවාදී, ධනවාදී, මිශ්‍ර
- වෙළෙඳපල ආර්ථිකය සංකල්පය හා එහි විවිධ ස්වරූප හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික ක්‍රමය හා සංවර්ධනය
- තාක්ෂණික දියුණුව , ගෝලීය කරණය හා ශ්‍රී ලංකාව.

ආර්ථික පද්ධතින් විශ්ලේෂණය සඳහා උපකාරී වන සමාජ ආර්ථික දර්ශකයන් පිළිබඳ අවබෝධයක් සිසුනට ලැබිය යුතුය. අනෙකුත් රටවල් පිළිබඳ සංසන්දනාත්මක සිද්ධි අධ්‍යයනයන් හා සමග විවිධ ආර්ථික පද්ධතින් පිළිබඳ ස්වයං අධ්‍යයනයට යොමු කළ යුතුය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 5. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය (කාලච්ඡේද 15)

මෙහිදී සමාජයන්හි මතුවිය හැකි ගැටුම් හා ඒවා සාමකාමීව විසඳා ගැනීම පිළිබඳ අවබෝධයක් ලැබිය යුතුය.

### නිපුණතා

1. විවිධ වර්ගයේ ගැටුම් අවබෝධ කර ගනියි.
2. ගැටුම් නිරාකරණය සඳහා ධනාත්මක ප්‍රවේශයන් ගවේෂණය කරයි.
3. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය කිරීමේ වැදගත්කම අගය කරයි.

### විෂය අන්තර්ගතය

- ගැටුම් හැඳින්වීම
- ගැටුම් වර්ග සහ ගැටුම් ඇතිවන මූලයන්
  - ගැටුම් වර්ග - දේශපාලන, සමාජ ආර්ථික, වාර්ගික
- ගැටුම් නිරාකරණය කිරීමේ විවිධක්‍රම.
- ගැටුම් මගහැරීමේ හා සාමකාමීව විසඳාගැනීමේ වාසි.

ශ්‍රී ලංකාවේ තත්වය හා සංසන්දනාත්මකව අවම වශයෙන් වෙනත් රටවල අවස්ථා දෙකක්හෝ පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සිදු කළ යුතුය. සාර්ථක ගැටුම් නිරාකරනතත්වයන් මෙන්ම අසාර්ථක අවස්ථාවන්ද ගෙනහැර දැක්විය යුතුය. සාමකාමී විසඳුමක් පිළිබඳ සම්භාවිතාවන් මෙන්ම අපහසුතාවන් ද අවබෝධකොට ගැනීම පහසු වනසේ සංවාද වල යෙදිය යුතුය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.